**පදවිය ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-------------------------------**

**01. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 04 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 23 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 02 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට පදවිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබෙන රු.242,590 ක්වූ උපකරණවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි අක්කර 95 ක වපසරියකින් යුත් සුසාන භූමි 19 ක වටිනාකම් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණු අතර සුසාන භූමි 07 ක් වටා ආරක්ෂිත වැටවල් ඉදිකිරීමට වැයකර තිබෙන රු.2,003,810 ක වියදමද ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් 2014 වර්ෂයේදී සභාවට ලබාදී තිබුණු රු.166,071 ක්වූ ගැල්වනයිස් බට 150 වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණ අතර එම ගැල්වනයිස් බට සභා මන්ත්‍රීවරුන් වෙත බෙදාහැර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ලබාදී තිබුණු එකතුව රු.433,280 ක්වූ ගොඩනැගිලි සහ අනෙකුත් උපකරණවල වටිනාකම් ස්ථාවර වත්කම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඉ) සභාවට ලබාදී තිබුණු අංක WPLL-2109 දරන ජල බවුසරය හා අංක NCRD 2739 දරන ට්‍රැක්ටරයෙහි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි.

(ඊ) දිර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කරන රු.259,069 ක්වූ තොග අගයට අදාල භෞතික තොග සභාව සතුව නොතිබුණි.

**02.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.73,325 ක්වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,002,672 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **උසාවි දඩ**

සභාව විසින් පවත්වාගෙන යනු ලබන උසාවි දඩ මුදල් ලේඛනයට අනුව සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ලැබිය යුතු රු.773,018 ක්වූ උසාවි දඩ ආදායම අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

**2.2.2** **මුද්දර ගාස්තු**

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ලැබියයුතු එකතුව රු.203,000 ක්වූ මුද්දර ගාස්තු **ආදායම** අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**03.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාවේ සේවය කර ස්ථාන මාරු වී ගොස් සිටින නිළධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.47,666 ක්වූ සේවක ණය ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව විසින් නඩත්තු කරනු ලබන හා ප්‍රයෝජනයට ගන්නා අක්කර 21.5 වපසරියකින් යුත් ඉඩම්වල වර්තමාන වටිනාකම තක්සේරුකර නොතිබුණු අතර පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 03 හි 03 ඡේදය පරිදි එම ඉඩම්වල අයිතිය සභාව වෙත පවරා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2005 නොවැම්බර් 08 දිනැති අංක PL/07/01/53 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 06 හි 2.2(iii) ඡේදයෙහි දක්වා ඇති පරිදි සභාව විසින් අඛණ්ඩව ක්‍රියාත්මක වන මාර්ග නඩත්තු ක්‍රමයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳව වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

## 3.2 වත්කම් කළමනාකරණය

-----------------------------

**නිශ්ක්‍රිය වත්කම්**

-------------------

(i) සභාව සතුව පවතින රු.1,319,050 ක්වූ අංක WPLE 7506 කැබ්රථය ධාවනය කළ නොහැකිව භාවිතයෙන් ඉවත්කර තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් වූ ඉදිරි ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.

(ii) සහල් පිටි ආශ්‍රිත බේකරි ආහාර නිෂ්පාදනය ප්‍රචලිත කිරීම සඳහා රු.814,000 ක්වූ යන්ත්‍ර උපකරණ උතුරුමැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2007 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට ලබාදී තිබුණු අතර, සභාව විසින් එම යන්ත්‍ර වලින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා 2016 මාර්තු මාසය වනවිටද කටයුතු කර නොතිබුණි.

(iii) පදවිය ප්‍රාදේශීය ලේකම් විසින් පරිත්‍යාග වශයෙන් සභාවට ලබාදී තිබෙන ධීවර ඔරු 17 ක් අදාල කාර්යයට යොදා නොගෙන සභා භූමියේ රඳවා ගෙන තිබුණි.

## 3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂයේදී රු.6,237,878 ක් වැයකර පදවිය අලිවංගුව ප්‍රදේශයේ පිළිසරු ව්‍යාපෘති මධ්‍යස්ථානය ඉදිකර තිබුණද, 2016 මැයි මාසය වන විටත් අදාල අරමුණ වෙනුවෙන් එම ගොඩනැගිලි සහ උපකරණ යොදා ගෙන නොතිබුණි.
පදවිය ග්‍රෙවල් කන්ද ප්‍රදේශයේ අක්කර 01 ක විවෘත භූමියකට කසල බැහැර කිරීම හේතුවෙන් පාරිසරක ගැටළු ඇතිවී තිබුණි.

## 04. පද්ධති හා පාලනය

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය